**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ ( අතිරේක මූල්‍යායනය) - 2015**

**------------------------------------------------------------------------------**

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යායනය) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2011 දෙසැම්බර් 14 දින එළඹි අංක 2767 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ ii ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**----------------------------------------------------------------------------------**

ණය ගිවිසුම අනුව එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ග කිලෝමීටර් 60 ක් පමණ වැඩිදියුණු කිරීම පුනරුත්ථාපනය කිරීම් හා යළි සම්බන්ධ කිරීම් මගින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 105.60 කට සමාන රු.මිලියන 13,728 ක් වූ අතර ඉන් එජඩො මිලියන 85 කට සමාන රු.මිලියන 11,050 ක් මූල්‍යායනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි.මෙම ව්‍යාපෘතියේ කටයුතු 2011 දෙසැම්බර් 14 දින ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂිතය. කෙසේ වුවද, ණය ලබා ගැනීමේ අවසන් දිනය 2016 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම

මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැසඳීමට පත්වන ලෙස සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති ගැලපීම්වලින් පැන නගින බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක හා අවසාන ශේෂ සහ ණය යටතේ ආපසු ගැනීම් හා විශේෂ ඩොලර් ගිණුමට කරන ලද වියපැහැදම් ව්‍යාපෘතිය නඩත්තු කරන පොත් හා වාර්තා අනුව සත්‍ය හා සාධාරණ ලෙස අනාවරණය කරනු ලැබූ බවද 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග එදිනට සතුටුදායක ලෙස සැසඳී තිබූ බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය යටතට ගැනෙන විදේශ අරමුදල් ව්‍යාපෘති 03 ක සිදුකරන ලද මෙහෙයුම් පිරිවැය එකතුව රු.මිලියන 31 ක් සමානුපාතිකව අදාළ ව්‍යාපෘතිවලට වියදම් ලෙස ඇතුලත් කිරීම වෙනුවට මෙම ව්‍යාපෘතියේ වියදම් ලෙස සලකා තිබුණි.

(ආ) හික්කඩුව සිට දකුණු අධිවේගී මාර්ගය දක්වා වූ පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් වැඩ වල සහතික කළ පිරිවැය රු. මිලියන 213.22 ක් 2015 දෙසැම්බර් 31 දිනට ගිණුම් වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ අවසානයට කෙරීගෙන යන සිවිල් වැඩ වල වටිනාකම හා වගකීම් අදාල ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා ලිඛිතමය සාක්ෂි නොමැති වීම

සමාලෝචිත වර්ෂය අවසානයට වාර්ෂික සමීක්ෂණ කටයුතු සිදු කර ඇතත්, රු.මිලියන 1.59 ක වටිනාකමකින් යුතු වත්කම් සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.3 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/12 දරන චක්‍රලේඛ 8.3.9 හා 8.6 ඡේද වලට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අදාල වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම් රු.මිලියන 1.40 ක් හා පොදු කාර්ය වියදම් රු.මිලියන 2.61 ක් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1. අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, හා සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යාමය දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 85.00 | 11,050 | 3,126 | 17.24 | 2,334 | 68.62 | 8,996 |
| ශ්‍රී ලංකා රජය | 20.60 | 2,678 | 1,480 | 10.14 | 1,478 | 32.80 | 4,665 |
| | 105.60 | 13,728 | 4,606 | 27.38 | 3,812 | 101.42 | 13,661 |

ඉහත තොරතුරු අනුව, ණය ප්‍රතිපාදනය වූ එජඩො මිලියන 85 ට සමාන රු. මිලියන 11,050 න් සියයට 80 ක් නියෝජනය වන එජඩො මිලියන 68.62 සමාන රු.මිලියන 8,996 ක් 2015 දෙසැම්බර් 31 දිනට ණය යටතේ උපයෝජනය කර තිබුණි.

**3.2** **භෞතික ප්‍රගතිය**

-------------------

ලැබී ඇති තොරතුරු අනුව ජාතික මාර්ග 05 ක කිලෝමීටර් 44.83 ක මාර්ග කොටස් කිහිපයක වැඩි දියුණු කිරීම් 2015 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර තිබුණි. තවද 2015 ජූලි හඳුන්වාදුන් ව්‍යාපෘතියේ අතිරේක වැඩ වශයෙන් පාමංකඩ - කැස්බෑව මාර්ගය හා නුගේගොඩ -හෝමාගම මාර්ග කොටස් කිහිපයක් ව්‍යාපෘති කාලය අවසන් වන විටත් නිම කර නොතිබුණි.

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සාමාන්‍ය ලක්ෂණයක් වශයෙන් මාර්ග වැඩි දියුණු කිරීම් වැඩ කිහිපයක ඇතුලත් මුල් නිර්මාණ සැලසුම් වල විෂය පථය පසුව ව්‍යාපෘතිය විසින් වෙනස් කර තිබුණි. මේ හේතුවෙන් මාතර - ගොඩගම මාර්ගයේ වැඩි දියුණු කිරීම් වැඩ වල මුල් ප්‍රමාණ පත්‍ර වල ඇතුලත් රු.මිලියන 161.73 ක කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20.09 ක් නියෝජනය වන වැඩ අයිතම් 214 ක් අවලංගු කොට රු.මිලියන 116.57 ක් වටිනා මුළු කොන්ත්‍රාත්තුවෙන් සියයට 20.5 ක් නියෝජනය වන නව වැඩ අයිතම් 15ක් හඳුන්වා දී තිබුණි. තවද, අලුත්ගම සිට දකුණු අධිවේගී මාර්ගය දක්වා වැඩි දියුණු කිරීමේ විෂය පථයේ රු.මිලියන 737.64 ක් වටිනා ප්‍රමාණපත්වල වැඩ අයිතම් 326 ක් අවලංගු කිරීමෙන් කොන්ත්‍රාත්කරුට අතිරේක වැඩ පූර්ව අත්තිකාරම් මත අයුතු මූල්‍ය ප්‍රතිලාභයක් ලබා ගැනීමට ඉඩ හැර තිබුණි.

(ආ) අලුත්ගම සිට දකුණු අධිවේගී මාර්ගය හා හික්කඩුව සිට දකුණු අධිවේගී මාර්ග වල පුනරුත්ථාපන වැඩ සඳහා සම්බන්ධ වූ කොන්ත්‍රාත්කරුවන්ගේ අවිධිමත් වැඩ සැලසුම් හා යෙදවූ ශ්‍රම බලකා ඌනතා වැනි අසමත්කම් සැලකිල්ලට නොගෙන එක් එක් කොන්ත්‍රාත්කරුට දින 90 බැගින් කාලය දිගු කිරීම් අනුමත කොට තිබූ බව 2015 මැයි 07 දින පැවැත්වූ මෙහෙයුම් කමිටු වාර්තාවෙන් අනාවරණය විය. තවද, ඉහත සඳහන් කරන ලද මාර්ග වෙනුවෙන් පිළිවෙලින් ප්‍රාරම්භක වැඩ සඳහා අතිරේක පිරිවැය රු.මිලියන 22.51 ක් හා රු.මිලියන 26.80 ක් සහ මිල විචලනයන් සඳහා රු. මිලියන 20.33 ක් හා රු.මිලියන 8.53 ක් වැය කර තිබුණි. ඊට අමතරව ප්‍රමාද ගාස්තු රු.මිලියන 38.93 ක් ව්‍යාපෘතියෙන් හිලව් කර තිබුණි.

(ඇ) නියමිත කාලයට වැඩ බිම කොන්ත්‍රාත්කරුට භාරදීමට ව්‍යාපෘතිය අසමත් වීම හේතුවෙන් කටුකුරුන්ද සිට නාගොඩ මාර්ගය වැඩි දියුණු කිරීම දින 90 ක ප්‍රමාදයක් සහිතව නිම කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 15.19 ක මිල විචලනයන් හා රු.මිලියන 17.31 ට ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ඈ) හික්කඩුව සිට දක්ෂිණ අධිවේගී මාර්ගය දක්වා මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ වල වැඩ විෂය පථයට ඇතුළත් නොවූ ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය හා ප්‍රාදේශීය පළාත් පාලන ආයතනය විසින් සිදු කළ යුතු වූ ජලනල මාර්ග වෙනස්කම් හා වෙනත් යටිතල සංවර්ධන වැඩ සඳහා ව්‍යාපෘතිය රු.මිලියන 74.82 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) පහත සඳහන් හේතූන් නිසා නුගේගොඩ - හෝමාගම මාර්ග වැඩි දියුණු කිරීම් වැඩ වල තත්ත්ව පාලන කටයුතු සහතික වීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(i) කොන්ත්‍රාත් කොන්දේසි වගන්ති 4.9 අනුව කොන්ත්‍රාත් වැඩ ආරම්භකොට දින 28ක් ඇතුලත තත්ත්ව කළමනාකරණ සහතික සැලසුම් පද්ධති ඉදිරිපත් කළ යුතු නමුත් කොන්ත්‍රාත්කරු එය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු තත්ත්ව පාලන පරීක්ෂකවරු සේවයේ නොයෙදවීම නිසා කටයුතු 12 ක තත්ත්ව ප්‍රමිති පරීක්ෂණ ලැයිස්තු වල තත්ත්ව පාලන සහතිකද පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ii) විචලන නියෝගයන් යටතේ සිදු කරන ලද පෙර සවි කොන්ක්‍රිට් ආවරණ (Cover Slab) වල හා Interlock Paving Blocks වල තිබිය යුතු පීඩන ශක්තිය පරීක්ෂා කර නොතිබුණු අතර ඒ සඳහා පිළිවෙලින් රු.මිලියන 6.27 ක් හා රු.මිලියන 1.45 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(iii) 2015 අප්‍රේල්, සැප්තැම්බර්, ඔක්තෝබර් හා නොවැම්බර් පරීක්ෂණ වාර්තා ප්‍රතිඵල අනුව කිලෝමීටර් 1 + 000 සිට කිලෝමීටර් 15+360 දක්වා සිදු කරන ලද ඇස්පෝල්ට් කොන්ක්‍රීට් බැදුම් ස්ථරයේ තිබිය යුතු උපරිම ඝනකම මිලිමීටර් 35 සිට මිලිමීටර් 75 දක්වා පරාසයක වුවත් එය මිලිමීටර් 104.6 සිට මිලිමීටර් 122 පරාසයක පැවතුණි. තවද, පරීක්ෂණ වාර්තා අනුව ඉහත මාර්ග කොටසේ ඇස්පෝල්ට් කොන්ක්‍රීට් මතුපිට ස්ථරයේ තිබිය යුතු ඝනකම මිලිමීටර් 45 සිට මිලිමීටර් 55 පරාසයක වුවත් මිලිමීටර් 91.7 සිට මිලිමීටර් 108 දක්වා පරාසයක පැවතුණි.

### 3.4 පරිබාහිර කටයුතු

---------------------

ලැබී ඇති තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් එකතු කළ අගය මත බදු නිදහස් වීම ලබා ගැනීමට කාලානුරූපී ක්‍රියා කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස එකතු කළ අගය මත බදු ලෙස පාමංකඩ - කැස්බෑව මාර්ග වැඩි දියුණු කිරීමේ වැඩ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වයෙන් රු.මිලියන 27.34 ක මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

### 3.5 ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1,343 ක් මාර්ග 05 ක වැඩි දියුණු කිරීම් වල ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදනය කර ඇතත්, 2015 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම් වන්දි ලෙස රු.මිලියන 2,582 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. අත්පත් කර ගත යුතු රජයේ ඉඩම් හා පුද්ගලික ඉඩම් විස්තර, ඉඩම් හා නැවත පදිංචි කිරීමේ කමිටුවේ ගෙවීම් සඳහා අනුමැතිය හා ඉඩම් අත්පත් කර ගැනීම් කටයුතු සඳහා සිදු කල අත්තිකාරම් ගෙවීම් විස්තර යනාදිය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නොතිබීම හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වල වන්දි ගෙවීම් සඳහා යෙදූ මූල්‍ය පාලන ක්‍රම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.